**වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**-----------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

**ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**1.4 අනුකූල නොවීම**
**-------------------**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**
**---------------------------------------------------------------------------**

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරි පුද්ගලයන්ට | අදාළ පනතේ විධිවිධානවලට අනුව | හිඟ මුදල් අයකිරීමට කටයුතු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | 158 (i) වගන්තිය | සභාපතිවරයා විසින් වරෙන්තු නිකුත් කර නොතිබුණි. | කටයුතු කළ යුතු වේ. | |
| (ඇ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති | | | |
| | - X පරිච්ඡේදයේ 193 වගන්තිය | සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් පිළිබඳ විස්තර අයවැය ඇස්තමේන්තුව සමඟ සසඳා විචලනයන් සඳහා පැහැදිලි කිරීම් ඇතුළත් ප්‍රකාශය පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත මූල්‍ය හා පරිපාලන රීතින්වලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඇ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 04ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වාහන සඳහා ඉන්ධන පරිභෝජනය පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කර ඇත. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක් විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් එලෙස අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වේ. | මේ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇත. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 64,654,300 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 7,191,680 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 129,500 | - | 222,089 | 2,397,676 | 670,400 | - | - | - |
| කුලී | 15,598,396 | - | 16,524,871 | 2,124,915 | 22,765,680 | - | 2,677,922 | 6,266 |
| බලපත්‍ර ගාස්තු | 1,585,400 | - | 1,988,320 | - | 1,764,000 | - | 322,999 | - |
| වෙනත් ආදායම් | 100,074,214 | - | 112,690,656 | 50,324,764 | 93,969,070 | - | 35,749,308 | 6,418,520 |
| | 117,387,510 | - | 131,425,936 | 54,847,356 | 119,169,150 | - | 38,750,229 | 6,424,786 |

* බිල් කළ ආදායම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.38,750,229 ක් වුවත් 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.131,425,936 කින් වැඩි වීම නිසා 2018 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම වැඩි වීමේ කාර්යසාධනය රු.92,675,707 ක් වී තිබුණි. එසේ වුවත් ආදායම් බිල් කිරීමට සභාව අපොහොසත් වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත හිඟ වරිපනම් බදු වර්ෂයේ ඒකතුව රු.2,397,676 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කෙරෙමින් පවතී. |

**2.2.4 කුලී**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.128,199 ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වෙළෙඳ පොළ හිඟ බදු කුලී රු.1,837,740ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | හිඟ බදු කුලී සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතු වේ. | වර්තමානයේ අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් පවතී. |

**2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.6,845,462 ක් සහ මුද්දර ගාස්තු රු.8,262,742 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30 ක් පිළිබඳව අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් මූලික කරුණු 06 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කර තිබුණි. | සඳහන් කළ සියලුම කාරණා ක්‍රියාත්මක කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. |

#### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව පැවති ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර ඇත. |

#### (ඇ) මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් සකස් කළ කොන්ත්‍රාත් කාර්යයන් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ කොන්ත්‍රාත් කාර්යයන් 25 කින් කොන්ත්‍රාත් | ලැබෙන ප්‍රතිපාදන අනුව වැඩසටහන් සකස් කළ යුතු වේ. | සියළුම අරමුදල් නොලැබීම නිසා වැඩසටහන් ක්‍රියාත්මක කළ නොහැකිවි තිබුණි. වර්තමානයේ වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කරමින් පවතී. |

කාර්යයන් 02 ක් සඳහා පමණක් ක්‍රියාත්මක කර තිබුණි. අනෙකුත් රු.24,110,000 ක් වටිනා ක්‍රියාකාරකම් 23 ක් ක්‍රියාත්මක කළ නොහැකි විය.

**(ඇ) අතහැර තිබූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂවල ඉටුකර තිබූ රු.2,999,724 ක් වටිනා මුදලෙයික්කුලී පානීය ජල බෙදාහැරීම් ව්‍යාපෘතිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගැනීමකින් තොරව අතහැර දමා තිබුණි. | අදාල අරමුණු ඉටු කර ගත යුතුවේ. | ක්‍රියාත්මක කිරීමට කටයුතු කෙරෙමින් පවතී. |

**(ඉ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මන්ඩාවිල් ප්‍රදේශය ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරා ගෙන තිබුණද ජාතික ප්‍රතිපත්තිවලට අනුව වෙන්කිරීම් නොකර, රැස්කර තිබූ අතර කසල බැහැර කරන ස්ථානවල දෛනිකව රැස්කරන කසල කැබලිවලට කපා පස්දමා වසා නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ කාර්යයන් අධීක්ෂණය කළ යුතු වේ. | අදාල ක්‍රියාමාර්ග ගනිමින් පවති. |
| (ii) | ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට කාලයෙන් කාලයට සිදු කළ යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | සෞඛ්‍ය කම්කරුවන්ට වාර්ෂිකව වෛද්‍ය පරීක්ෂණයන් සිදු කළ යුතු වේ. | ඉදිරියේදි අදාල ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

**(ඊ) පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නියමිත ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | ක්‍රියාමාර්ගයන් ගෙන ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | නියමිත වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොතිබුණි. |
| (ආ) | සභාවේ සුසාන භූමි මුරකරුවන් දෙදෙනෙකු සේවයේ යොදවා තිබුණද, සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සුසාන භූමි 13කින්ම සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ක්‍රියාමාර්ගයන් ගෙන ඇත. |
| (ඇ) | සභා බලප්‍රදේශයේ පවතින දේපළ 12018කින් වර්ෂ 48 කට අධික කාලයක සිට වරිපනම් බදු යළි ඇගයීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | වරිපනම් බදු යළි ඇගයීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. | තක්සේරු දෙපාර්තමේන්තුවෙන් නැවත තක්සේරු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. මේ නිසා ඉදිරි කටයුතු කළ නොහැකි වී ඇත. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබු බැවින්, එවැනි මානව සම්පත් 21 ක් විසින් නිම කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිරවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1987 අංක 15 දරන සභා බල ප්‍රාදේශීය සභා පනතේ 134 වගනත්තියට අනුව වරිපනම් බදු අයකිරීමට වාර්ෂිකව සභාව විසින් දේපල හිමියන්ට K ආකෘති පත්‍ර ලබාදිය යුතු වුවත්, 2018 වර්ෂයේ දේපල 12018 ක් සඳහා "K" ආකෘති පත්‍ර නිකුත් කර නොතිබුණි. | සභාව විසින් පනතේ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කෙරෙමින් පවති. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව භාවිතා කරන වාහන 04ක් මේ දක්වා සභාවේ නමට අයිතිය මාරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාවේ නමට අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. | වාහන සඳහා ලියාපදිංචි කිරීමේ ලේඛන නොමැති වීමෙන් අයිතිය මාරු කිරිමට කටයුතු කළ නොහැකි වී ඇත. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කඩ්ඩායි වෙලි හි පිහිටි පෙර පාසලේ ලී බඩු නඩත්තු කිරීමෙන් තොරව අක්‍රියව පැවතුණු අතර එනමුත්, පසුගිය වර්ෂ 05 පුරාම එම පාසල ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පැවැතිණි. | තක්සේරු මණ්ඩලයේ නිර්දේශ අනුව කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් කටයුතු කෙරෙමින් පවති. |
| (ආ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය සඳහා රු.2,208,000කට මිලදී ගනු ලැබූ පිරියත වර්ෂයකට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවැතුණි. | යන්ත්‍රය අඛන්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. | යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. |

## 3.6 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම භාණ්ඩ හා සේවා ක්‍රියාවලිය සඳහා පිළියෙල කර තිබිය යුතුවේ. ඒසේ වුවත් සභාව විසින් සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුව භාණ්ඩ හා සේවාවන් සකස් කළ යුතුය. | පිළිතුරු ලබා දී නොමැත. |

# 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් සහ තථ්‍ය පුනරාවර්තන වියදම් හා සැසඳීමේදි සේවක වැටුප්, ගමන් වියදම්, භාණ්ඩ හා අවශ්‍යතා, මූලධන වත්කම් අලුත්වැඩියා සහ නඩත්තුව, පොළී ගෙවීම්, කොටස් ලාභ, සහනාධාර, විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික වැනි වියදම් හිතකරවත් පැටවුම් හා ගොඩබෑම්, සන්නිවේදන සම්බන්ධතා සේවාවන් සහ වෙනත් සේවාවන් අහිතකරවත් පැවතුණි. | අයවැය නිවැරදි අයුරින් සකස් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අනපේක්ෂිත ආදායම් සහ වියදම් ඇති වීමෙන් විචලනයන් පැවැතුණි. |